# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2020
## උපකාරක ප්‍රශ්න පත්‍රය

| ශ්‍රේණිය 11 | විෂයය : කෘෂි හා ආහාර තාක්ෂණය | පත්‍රය: I | කාලය: පැය 01 යි |
|---|---|---|---|

සැලකිය යුතුය.

- 1 - 40 දක්වා සියලු ම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) (2) (3) (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුරු තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) යොදන්න.

---

(01) හරිත විප්ලවය නිසා කෘෂිකාර්මික ක්ෂේත්‍රයට එකතු වූ නව යෙදවුමක් වන්නේ,

(1) කාබනික පොහොර ය. (2) දේශීය බෝග ප්‍රභේද ය.

(3) කෘෂි රසායනික ද්‍රව්‍ය ය. (4) පාරම්පරික දැනුම භාවිතය ය.

(02) සූර්යය දීප්තමානය භාවිත කරන්නේ පහත කුමන කාළගුණික පරාමිතියේ දත්ත ලබාගැනීම සඳහා ද?

(1) ආලෝකයේ තීව්‍රතාවය

(2) ආලෝකයේ කාලසීමාව

(3) ආලෝකයේ ගුණාත්මය

(4) ආලෝකයේ ඇති කිරණ වර්ග හඳුනා ගැනීමට

(03) පහත සඳහන් ප්‍රකාශ අතරින් වර්ෂා ක්‍රම පිළිබඳව වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) අන්තර් මෝසම් වැසි මාර්තු, අප්‍රේල් මාසවල පමණක් ඇති වේ.

(2) තද සුළං සහිත අඛණ්ඩ තද වැසි මෝසම් කාලවල දී ඇති වේ.

(3) වායුගෝලයේ ඇතිවන පීඩන වෙනස නිසා වාසුළි වැසි ඇති වේ.

(4) සංවහන වැසි බහුලව ඇති වන්නේ දිනයේ උදෑසන කාලයේ දී ය.

(04) ශ්‍රී ලංකාවේ කෘෂි පාරිසරික කලාප වර්ගීකරණයේ දී අඩුම කෘෂි පාරිසරික කලාප සංඛ්‍යාවක් සහිත කෘෂි දේශගුණික කලාපය වන්නේ,

(1) උඩරට තෙත් කලාපය ය. (2) පහතරට තෙත් කලාපය ය.

(3) මැදරට අතරමැදි කලාපය ය. (4) පහතරට වියළි කලාපය ය.

(05) ශිෂ්‍යයෙකු පස් නියැදියක් ගෙන බර කිරා, උදුනක තබා $105^{o}C$ ක උෂ්ණත්වයේ පැය 24 ක් පුරා රත් කර නැවත බර කිරන ලදී. රත් කළ පසුව පස් නියැදියේ බර මුල් වරට වඩා අඩු ය. ගුරුතුමා පැවසුයේ පසේ අඩංගු ජලය ඉවත්වීම නිසා බර අඩු වූ බවයි. මෙම පස් නියැදියෙන් ඉවත් ව ඇති පාංශු ජල ආකාර වන්නේ, පහත සඳහන් A, B හා C අතරින්,

A - ගුරුත්වාකර්ෂණ ජලය B - කේශාකර්ෂණ ජලය C - ජලාකර්ෂණ ජලය

(1) A පමණි ය. (2) A හා B පමණි ය.

(3) A හා C පමණි ය. (4) A ,B හා C යන සියල්ලම ය.

(06) ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ පසේ pH අගය සෑම විට ම 7 වඩා අඩු අගයක පවතී. එයට බලපාන ප්‍රධාන හේතුව වන්නේ,

(1) රසායනික පොහොර අධිකව භාවිත කිරීම ය.
(2) වාරි ජලය වගා කටයුතු සඳහා යොදා ගැනීම ය.
(3) අධික වර්ෂාපතනය නිසා පස සෝදා යාම ය.
(4) පසේ අඩංගු කැල්සියම් අයන ප්‍රමාණය වැඩි වීම ය.

(07) රතු දුඹුරු පස බහුලව ව්‍යාප්තව පවතින ප්‍රදේශ දක්වෙන පිළිතුර තෝරන්න.

(1) මහනුවර, නුවරඑළිය, ගම්පහ (2) හම්බන්තොට, අනුරාධපුරය, අම්පාර
(3) කළුතර, අනුරාධපුරය, මාතර (4) බදුල්ල, නුවරඑළිය, මහනුවර

(08) බෑවුම් භූමිවල මතුපිටින් ගලායන ජලය සමඟ තුනී ස්ථරයක් ලෙස පස් අංශු සේදී යාම හඳුන්වන්නේ,

(1) විසිරි ඛාදනය ලෙස යි. (2) ස්ථරීය ඛාදනය ලෙස යි.
(3) ඇලි ඛාදනය ලෙස යි. (4) අගල් ඛාදනය ලෙස යි.

(09) බද්ධ පැණි දොඩම් පැළයක් සැකසීමේ දී එහි ග්‍රාහකය ලෙස යොදාගත යුත්තේ පහත කුමන කුලයට අයත් ශාකයක් ද?

(1) රූටේසියේ (2) ඇනකාඩියේසියේ
(3) මැල්වේසියේ (4) ඇරිකේසියේ

(10) බිම් සැකසීමේ දී කොකු නගුල භාවිත කරන අවස්ථාව හා ක්‍රියාකරවීම සඳහා යොදාගන්නා බලය නිවැරදිව දක්වෙන පිළිතුර තෝරන්න.

| | බිම් සැකසීමේ අවස්ථාව | යොදා ගන්නා බලය |
|---|---|---|
| (1) | ප්‍රාථමික බිම් සැකසීම | මිනිස් බලය |
| (2) | ද්විතියික බිම් සැකසීම | යන්ත්‍ර බලය |
| (3) | ඇලි වැටි සැකසීම | සත්ව බලය |
| (4) | අතුරුයත් ගෑම | යන්ත්‍ර බලය |

(11) තනි වගා වලවල්වල නිශ්චිත පරතරයක් සහිතව වගා කිරීමට වඩාත්ම සුදුසු බෝග කාණ්ඩය වන්නේ,

(1) වී, තල, කුරක්කන් ය. (2) මිරිස්, කැරට්, තක්කාලි ය.
(3) රාබු, තම්පලා, සාරණ ය. (4) පතෝල, කරවිල, වට්ටක්කා ය.

(12) තවාන් පැළ දැඩි කිරීම සඳහා සිදු කරන කාර්යයක් වන්නේ,

(1) තවානට ජලය යොදන වාර ගණන අඩු කිරීම ය.
(2) තවානේ වල් පැළ පාලනය කිරීම ය.
(3) තවාන් පැළ අතර කුන්තාන් යෙදීම ය.
(4) තවාන් පැළ සෙවන කිරීම ය.

(13) පහත රූප සටහනේ A, B, C, D යන උපාංග නිවැරදිව නම් කළ පිළිතුර තෝරන්න.




(1) A - නැසින්න , B - පොම්පය , C - ජල ප්‍රභවය , D - පාර්ශ්වික නළ
(2) A - ජල ප්‍රභවය , B - පොම්පය , C - පාර්ශ්වික නළ , D - නැසින්න
(3) A - පොම්පය , B - ජල ප්‍රභවය , C - පාර්ශ්වික නළ , D - නැසින්න
(4) A - ජල ප්‍රභවය , B - පොම්පය , C - පාර්ශ්වික නළ , D - නැසින්න

(14) පසේ නිර්වායු ක්ෂුද්‍ර ජීවීන් ගහනය වැඩි වී කාබනික ද්‍රව්‍ය වියෝජනය වීමෙන් මීතේන් වැනි විෂ වායු නිෂ්පාදනය වීමට බලපාන ප්‍රධාන හේතුව වන්නේ,
(1) රසායනික පොහොර භාවිතය යි.
(2) පසේ දුර්වල ජලවහන තත්වයක් පැවතීම යි.
(3) අධික උෂ්ණත්වය නිසා ජලය වාෂ්පවීම යි.
(4) පස ආම්ලික වීම යි.

(15) වී වගාවේ බණ්ඩි පොහොර ලෙස යොදා ගන්නා TDM පොහොර (බණ්ඩි පොහොර) පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) අමිශ්‍ර පොහොරකි.
(2) පූර්ණ මිශ්‍ර පොහොරකි.
(3) අර්ධ මිශ්‍ර පොහොරකි.
(4) කාබනික දියර පොහොරකි.

(16) කොම්පෝස්ට් පොහොර නිපදවීමේ දී එහි අඩංගු පොස්පරස් හා පොටෑසියම් ප්‍රමාණය වැඩි කිරීමට එකතු කළ හැකි ද්‍රව්‍ය වන්නේ,
(1) ග්ලිරිසිඩියා හා අමුගොම ය.
(2) දුව අළු හා අළුහුණු ය.
(3) කුකුළු පොහොර හා පිදුරු ය.
(4) ඇසොල්ලා හා ගව මුත්‍රා ය.

(17) පහත දක්වෙන වල් පැළෑටි අතරින් බහුවාර්ෂික, ගොඩබිම වැවෙන පත් වර්ගයට අයත් පැළෑටියක් වන්නේ,
(1) තුනැස්ස ය.
(2) කලාඳුරු ය.
(3) බටදැල්ල ය.
(4) කඩුපහර ය.

(18) පූර්ව නිර්ගමන වල් නාශක භාවිත කරන්නේ,
(1) බිම් සකසන අවස්ථාවේ දී ය.
(2) බෝග බීජ ප්‍රරෝහණය වී, වල් පැළෑටි බීජ ප්‍රරෝහණයට පෙර ය.
(3) බෝග බීජ හා වල් පැළෑටි බීජ ප්‍රරෝහණයට පෙර ය.
(4) බෝග බීජ හා වල් පැළෑටි බීජ ප්‍රරෝහණය වූ පසු ය.

(19) ක්ෂේත්‍රයේ සිටුවා ඇති නිවිති වැලක පත්‍ර කහ පැහැ වී වර්ධනය බාල වී පසුව මිය ගියේ ය. පැළය උදුරා පරීක්ෂා කළ විට මූල පද්ධතියේ ගැටිති ආකාර ඉදිමුම් දැකිය හැකි විය. මෙම හානියට හේතුව විය හැක්කේ,
(1) වෛරස් ආසාධනයකි.
(2) දිලීර ආසාධනයකි.
(3) වටපනු ආසාධනයකි.
(4) බැක්ටීරියා ආසාධනයකි.

(20) පහත දැක්වෙන කෘමීන් අතරින්, සුහුඹුලා සතා පමණක් බෝගයට හානි සිදු කරන කෘමියා වනුයේ,

(1) අවුලකපෝරා ය. (2) ඉල්මැස්සා ය.
(3) එපිලැක්නා ය. (4) පොල් කළු කුරුමිණියා ය.

(21) අන්නාසි වගාවේ පිටිමකුණාගේ හානිය වැළැක්වීමට ගන්නා පූර්ව ප්‍රතිකර්මයක් වන්නේ,

(1) පස ජීවානුහරණය කිරීම ය.
(2) කෘමි විකර්ශක ශාක සිටුවීම ය.
(3) පැළ කෘමිනාශක දියරයක ගිල්වා සිටුවීම ය.
(4) පැළ දිලීරනාශක දියරයක ගිල්වා සිටුවීම ය.

(22) වී වගාවේ දී නයිට්‍රජන්, පොස්පරස්,පොටෑසියම් යන පෝෂකවලට අමතරව විශේෂයෙන් යෙදීමට නිර්දේශ කරනුයේ,

(1) කැල්සියම් ය. (2) සින්ක් ය. (3) සෝඩියම් ය. (4) මැග්නීසියම් ය.

(23) පහත රූපය ඇසුරින් පිළිතුරු සපයන්න.



මෙම වර්ධක කොටස් සිටුවන ලද බඳුන විනිවිද පෙනෙන වීදුරු තහඩුවකින් හෝ පොලිතීනයකින් ආවරණය කරන්නේ,

A - ප්‍රමාණවත් ලෙස ආලෝකය ලැබීමට ය.
B - උෂ්ණත්වය ඉහළ මට්ටමක පවත්වා ගැනීමට ය.
C - ඉහළ ආර්ද්‍රතාවයක් පවත්වා ගැනීමට ය.

ඉහත ප්‍රකාශ අතරින් වඩාත් නිවැරදි ප්‍රකාශ සහිත පිළිතුර තෝරන්න.

(1) A හා B ය. (2) B හා C ය. (3) A හා C ය. (4) A ,B හා C ය.

(24) කපු බීජ සිටුවීමට පෙර ගොම දියරයක ගිල්වා, වියළා ගැනීම සිදු කරනු ලැබේ. එයට හේතුව වන්නේ,

(1) බීජ සුප්තතාවය ඉවත් කිරීම ය.
(2) බොල් බීජ ඉවත් කිරීම ය.
(3) නයිට්‍රජන් තිර කරන බැක්ටීරියා හඳුන්වා දීම ය.
(4) බීජ වැපිරීම පහසු කිරීම ය.

(25) ඒක බීජ පත්‍රී බීජයක ආහාර සංචිතව ඇති කොටස වන්නේ,

(1) බීජ පත්‍රය ය. (2) භ්‍රෑණ පෝෂය ය. (3) බීජාවරණය ය. (4) බීජ මූලය ය.

(26) ගෙවත්තේ තිබෙන උසස් තත්ත්වයේ ගම්මිරිස් ශාකයකින් ඒ හා සමාන වූ පැළ ලබා ගැනීමට වඩාත්ම පහසු ක්‍රමය කුමක් ද?

(1) පටක රෝපණය (2) බීජ තවාන් කර පැළ ලබා ගැනීම.
(3) කැබලි සිටුවා ගැනීම (4) බද්ධ කිරීම

(27) ඒකීය සූර්ය ප්‍රචාරකය පිළිබඳ ව වඩාත් ම නිවැරදි වගන්තිය පහත පිළිතුරු අතරින් තෝරන්න.

(1) ශාක අතු කැබැල්ලක් මුල් අද්දවා ගැනීමට භාවිත කරනු ලැබේ.
(2) එයට දිනපතා ජලය සම්පාදනය කළ යුතු ය.
(3) ජලවහනය සඳහා ප්‍රමාණවත් ලෙස බඳුනේ සිදුරු තැබිය යුතු ය.
(4) වාතනය සඳහා දිනපතා ස්වල්ප වේලාවක් බඳුන විවෘත කළ යුතු ය.

(28) දූල් ගෘහ මගින් වඩාත් ම හොඳින් පාලනය කළ හැකි දේශගුණික සාධකය වන්නේ,

(1) උෂ්ණත්වය ය. (2) ආලෝකය ය.
(3) වර්ෂාපතනය ය. (4) සාපේක්ෂ ආර්ද්‍රතාවය ය.

(29) නිර්පාංශු වගාවේ දී භාවිත කෙරෙන ස්ටයිරපෝම් පෙට්ටිය කළු පොලිතීන් වලින් ආවරණය කරන්නේ,

(1) ජලය වාෂ්පීකරණය අවම කිරීමට ය.
(2) ඇල්බට් පොහොර මිශ්‍රණයේ මනා ක්‍රියාකාරීත්වයට ය.
(3) මූල මණ්ඩලය හොඳින් වර්ධනය වීමට ය.
(4) පලිබෝධ හානි හොඳින් පාලනය කිරීමට ය.

(30) සංරක්ෂණ ගොවිතැනට අයත් සිද්ධාන්ත භාවිත වන අවස්ථාවක් වන්නේ,

(1) කඩින් කඩ බෝග වගාව ය. (2) උඩරට ගෙවතු වගාව ය.
(3) අතුරු බෝග වගාව ය. (4) හෙල්මළු ක්‍රමයට වී වගාව ය.

(31) නිශා අන්ධතාවය හා ඇස්වල බිටෝ ලප ඇති වන්නේ පහත කුමන පෝෂකය ඌනවීම නිසා ද?

(1) විටමින් A (2) විටමින් B (3) විටමින් C (4) විටමින් D

(32) ආහාරයේ ඇති එන්සයිම, වායුගෝලීය වාතයේ ඇති ඔක්සිජන් සමඟ ගැටීම නිසා කපන ලද සමහර එළවළු හා පලතුරුවල කහට පිපීම සිදුවේ. මෙය වළක්වා ගැනීම සඳහා සිදු කරන පිළිමයක් වන්නේ,

(1) ජීවානුහරණය ය. (2) පැස්චරීකරණය ය. (3) සාන්ද්‍රිකරණය ය. (4) බ්ලාන්චිකරණය ය.

(33) බිත්තර නිෂ්පාදනය සඳහා යෝග්‍ය මධ්‍යධරණී සම්භවයක් සහිත කුකුළු වර්ගය වන්නේ,

(1) ලෙගෝන් ය. (2) සසෙක්ස් ය. (3) කොචින් ය. (4) ඔස්ට්‍රලොප් ය.

(34) සත්ත්ව ආහාර ලෙස ලබා දෙන බඩ ඉරිඟු, සහල් නිවුඩු, සුනුසහල් ආදියේ අඩංගු වන ප්‍රධාන පෝෂණ සංඝටකය වන්නේ,

(1) ඛනිජ ය. (2) විටමින් ය. (3) ලිපිඩ ය. (4) කාබෝහයිඩ්‍රේට ය.

(35) පහත වගන්ති අතරින් කිරි උණ රෝගය පිළිබඳව නිවැරදි වගන්තිය තෝරන්න.

(1) කිරි බොන අවධියේ දී වසු පැටවුන්ට වැලඳෙන රෝගයකි.
(2) රෝගයට හේතු වන්නේ වෛරස් ආසාදනයකි.
(3) සතාගේ දේහ උෂ්ණත්වය සීඝ්‍රයෙන් වැඩි වේ.
(4) කැල්සියම් ප්‍රමාණවත් පරිදි ලබාදීම මගින් පාලනය වේ.



බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සංවර්ධන අංශය

(36) කුකුළු පැටවුන්ගේ කොට කැපීම සිදුකරන්නේ පැටවුන්ගේ වයස,

(1) සති 2 - 4 තුළ දී ය. (2) සති 8 - 10 තුළ දී ය.

(3) සති 10 - 12 තුළ දී ය. (4) සති 18 - 24 තුළ දී ය.

(37) ගව පාලනයේ දී නැම්බියන් ලෙස හඳුන්වන්නේ,

(1) යෞවනෝදයට පත් නොවූ ගැහැණු සතුන් ය.

(2) යෞවනෝදයට පත් වූ ගැහැණු සතුන් ය.

(3) පළමු පැටවා ප්‍රසූත කිරීමට සිටින ගැහැණු සතුන් ය.

(4) වියළි කාලය ගත කරන ගැහැණු සතුන් ය.

(38) රැනිකට් රෝගය වැළැක්වීම සඳහා කුකුළන්ට ඖෂධ ලබා දෙන්නේ,

(1) එන්නත් කිරීමෙනි. (2) ඇසට බිංදු ලෙස දැමීමෙනි.

(3) පානීය ජලයට මිශ්‍ර කිරීමෙනි. (4) ආහාර සලාකයට මිශ්‍ර කිරීමෙනි.

(39) නවීකෘත අභ්‍යන්තර පරිසර තත්ත්ව යටතේ ආහාර ඇසිරීමේ දී සිදුකරන්නේ,

(1) ආහාර ද්‍රව්‍ය හා ඇසුරුම අධි උෂ්ණත්ව පරාසයකට ලක් කිරීම ය.

(2) ඇසුරුම තුළ කාබන්ඩයොක්සයිඩ් සංයුතිය වැඩි කිරීම ය.

(3) ඇසුරුම තුළ අඩංගු සියලු ම වාතය ඉවත් කිරීම ය.

(4) ටෙට්‍රාපැක් ඇසුරුමක ආහාර ද්‍රව්‍ය ඇසුරුම් කිරීම ය.

(40) එළකිරිවලට පොල් කිරි මිශ්‍ර කර ඇති විට එය සොයා ගැනීමට යොදා ගන්නා ද්‍රව්‍ය කුමක් ද?

(1) ග්ලිසරින් (2) අයඩින් (3) ග්ලූකෝස් (4) සෝඩියම්

| | | | |
|---|---|---|---|
| **බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** | | | |
| අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2020<br>උපකාරක ප්‍රශ්න පත්‍රය | | | |
| ශ්‍රේණිය 11 | විෂයය : කෘෂි හා ආහාර තාක්ෂණය | පත්‍රය: II | කාලය: පැය 02 යි |

සැලකිය යුතු ය.

- **පළමුවැනි ප්‍රශ්නය** හා **තවත් ප්‍රශ්න හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

---

(01) අනාගතයේ දී ඇති විය හැකි ලෝක ආහාර හිඟවීමේ අර්බුදයට මුහුණදීමේ පෙර සූදානමක් ලෙස, වර්තමානයේ දී ගෙවතු වගාව ජනප්‍රිය වෙමින් පවතී.

i. ගෙවතු වගාවේ දී අනුගමනය කරන බෝග වගා රටාව හඳුන්වන්නේ කෙසේ ද?

ii. ගෙවත්තේ වගා කළ හැකි පහත කුලවලට අයත් වැල් බෝග දෙක බැගින් ලියන්න.

a. ෆැබේසියේ - ..........................................................................................

b. කුකර්බිටේසියේ - ..........................................................................................

iii. ගෙවත්තෙන් ඉවත් කරන වල් පැළෑටි හා බෝග අවශේෂ ප්‍රයෝජනයට ගත හැකි ආකාර දෙකක් ලියන්න.

iv. කුඩා ගෙවත්තක ප්‍රාථමික බිම් සැකසීමට යොදාගත හැකි උපකරණ හතරක් ලියන්න.

v. අස්වැන්න නියමිත පරිණත අවස්ථාවට පත්වීමට පෙර නෙලා ගැනීම නිසා ඇතිවන ගැටලු දෙකක් ලියන්න.

vi. රසායනික පොහොර නොමැතිව බෝග වගා කිරීමේ වාසි දෙකක් ලියන්න.

vii. a. ගෙවත්තේ අතිරික්ත අඹ අස්වැන්න කල් තබා ගැනීමට යොදා ගත හැකි පරිරක්ෂණ ක්‍රමයක් ලියන්න.

b. වීදුරු ඇසුරුම්වල ආහාර ගබඩා කිරීමේ වාසියක් ලියන්න.

viii. පහත දැක්වෙන බීජ වර්ගවල සුප්තතාවය ඉවත්කර ගැනීමට සුදුසු ක්‍රමය බැගින් ලියන්න.

a. දඹල

b. තක්කාලි

ix. a. ජලවහනය දුර්වල අවස්ථාවල දී යොදා ගැනීමට සුදුසු කාණු රටාවක් නම් කරන්න.

b. එම කාණු රටාව රූප සටහනකින් දක්වන්න.

x. බෝග වගාවට අමතරව ගෙවත්තට එක් කළ හැකි වෙනත් අංග දෙකක් නම් කරන්න.

(ලකුණු 2X10 = 20)



බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සංවර්ධන අංශය

(02) බෝග වගාවේ දී වර්ෂාපතනය, උෂ්ණත්වය, සාපේක්ෂ ආර්ද්‍රතාව, සුළඟ හා ආලෝකය යන දේශගුණික සාධක වැදගත් වේ.

i. පහත එක් එක් දේශගුණික සාධකය මැනීම සඳහා යොදා ගන්නා මිනුම් ඒකකය ලියන්න.

a. වර්ෂාපතනය

b. උෂ්ණත්වය

c. ආලෝක තීව්‍රතාව

d. සුළඟේ වේගය

ii. පුෂ්ප පරාගනයට බලපාන සුළඟේ හිතකර හා අහිතකර බලපෑම් එක බැගින් ලියන්න.

iii. පාංශු ස්වභාවය අනුව වගා කටයුතු පිළිබඳ සැලසුම් සකස් කර ගැනීම සිදුවේ.

a. පාංශු ඛනිජ වර්ග නම් කරන්න.

b. පාංශු වයනය යනු කුමක් ද?

c. පාංශු වයනය වගා කටයුතු සඳහා වැදගත්වන ආකාර තුනක් ලියන්න.

(03) රෝපණ ද්‍රව්‍ය සිටුවා ප්‍රරෝහණයට හා පැළ වර්ධනයට හිතකර පරිසරයක් ලබා දෙමින් රැක බලා ගන්නා තාවකාලික ස්ථානය තවාන ලෙස හැඳින්වේ.

i. බීජ තවාන් කිරීමේ අරමුණු දෙකක් ලියන්න.

ii. a. උස් තවාන් පාත්තියක් සකස් කර ගන්නා ආකාරය අදාළ මිනුම් ද සඳහන් කරමින් පියවර ලෙස ලියන්න.

b. තවාන් පාත්තිය සඳහා යොදා ගන්නා තවාන් මිශ්‍රණය සකස් කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය හා ඒවා මිශ්‍රකරන අනුපාතය ලියන්න.

iii. තවාන් භාවිත නොකර කෙලින්ම ක්ෂේත්‍රයේ සිටුවන බීජ වර්ග හතරක් ලියන්න.

(04) ශාක ස්වභාවිකවම තව වර්ගය බෝ කිරීමට හැඩ ගැසී ඇත. එම හැකියාව උපයෝගී කරගෙන වගා කටයුතු වලට අවශ්‍ය රෝපණ ද්‍රව්‍ය නිපදවා ගනු ලැබේ.

i. a. ස්වභාවික වර්ධන ප්‍රචාරයේ දී යොදා ගන්නා භූගත කඳන් වර්ග හතරක් නම් කරන්න.

b. එම එක් එක් භූගත කඳන් වර්ගය සඳහා නිදසුන් එක බැගින් ලියන්න.

ii. a. බීජවල ප්‍රරෝහණ ප්‍රතිශතය සොයන ක්‍රමයක් නම් කරන්න.

b. එම ක්‍රමය සිදුකරන ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

iii.a. වායව අතු බැඳීම යනු කුමක් ද?

b. වායව අතු බැඳීම සිදුකළ හැකි පලතුරු ශාක දෙකක් නම් කරන්න.

(05) බෝග වගාවක පළිබෝධ පාලනය කිරීම මගින් එහි අස්වැන්න වැඩි කර ගැනීමට හැකි වේ.

i. a. වගා බිමක තුළ ඇති වල්පැළ පාලනයට ගත හැකි උපක්‍රම දෙකක් ලියන්න.

b. වගා බිමට පිටතින් වල්පැළ පැමිණීම පාලනය කළ හැකි ක්‍රම දෙකක් ලියන්න.

ii. a.හිටු මැරීමේ රෝගය හඳුනාගත හැකි ලක්ෂණ දෙකක් ලියන්න.

b. හිටු මැරීමේ රෝගය වළක්වා ගැනීම සඳහා යොදා ගත හැකි රෝග පාලන ක්‍රම දෙකක් ලියන්න.

iii. ඉල් මැස්සාගේ හානිය වළක්වා ගැනීමට යොදා ගන්නා රසායනික නොවන ක්‍රම දෙකක් ලියන්න.

(06) ශ්‍රී ලංකාව තුළ වර්තමානයේ දී සත්ත්ව පාලනය වඩාත් ලාභදායි ව්‍යාපාරයක් ලෙස ජනප්‍රියව වෙමින් පවතී.

i. a. සත්ත්ව පාලනය දියුණු කිරීම සඳහා රාජ්‍ය අංශයෙන් ලබා දෙන පහසුකම් දෙකක් සඳහන් කරන්න.

b. ශ්‍රී ලංකාවේ ගව පාලනය සඳහා බෙදා ඇති විශේෂිත කලාප අතරින් හතරක් ලියන්න.

ii. පහත දැක්වෙන එක් එක් ද්‍රව්‍ය කුකුළු පාලනයේ දී යොදා ගන්නා අවස්ථා ලියන්න.

a. අළු හුණු

b. සිප්පි කටු

c. විටමින් B හා ග්ලූකෝස් මිශ්‍රණය

iii. a. ගව දෙනකට මැස්ටයිටිස් රෝගය වැළඳුනු විට කිරිවල දැකිය හැකි වෙනස්කම් තුනක් ලියන්න.

b. කෘත්‍රිම සිංචනය කිරීමේ වාසි තුනක් ලියන්න.

(07) අහිතකර දේශගුණික සාධක හා පාංශු සාධකවලින් සිදුවන බලපෑම අවම කිරීමට පාලිත තත්ත්ව යටතේ බෝග වගාව සිදු කරනු ලැබේ.

i. a. නිර්පාංශු වගාව සඳහා තෝරා ගන්නා රෝපණ මාධ්‍යයක තිබිය යුතු ලක්ෂණ දෙකක් ලියන්න.

b. පොලිතීන් ගෘහ තුළ බෝග වගාවේ දී ඒවා තුළ උෂ්ණත්වය ඉහළ යාම පාලනයට යොදා ගත හැකි ක්‍රම දෙකක් ලියන්න.

ii. පාලිත තත්ත්ව යටතේ බෝග වගා කිරීමේ දී යොදා ගැනීමට වඩාත් ම සුදුසු වන්නේ බින්දු ජල සම්පාදනය යි.

a. බින්දු ජල සම්පාදන ක්‍රමය යොදා ගැනීමේ වාසි දෙකක් ලියන්න.

b. පාලිත තත්ත්ව යටතේ බෝග වගා කිරීමේ ප්‍රතාලාභ දෙකක් දක්වන්න.

iii. බෝග වගාවේ අස්වනු නෙලන විට අස්වැන්නට සිදුවිය හැකි හානි දෙකක් ලියන්න.

**කෘෂි හා ආහාර තාක්ෂණය**

**පිළිතුරු පත්‍රය**

## I පත්‍රය

| | | | |
|---|---|---|---|
| 1. 3 | 11. 4 | 21. 3 | 31. 1 |
| 2. 2 | 12. 1 | 22. 2 | 32. 4 |
| 3. 3 | 13. 2 | 23. 2 | 33. 1 |
| 4. 1 | 14. 2 | 24. 4 | 34. 4 |
| 5. 4 | 15. 3 | 25. 2 | 35. 4 |
| 6. 3 | 16. 3 | 26. 3 | 36. 3 |
| 7. 2 | 17. 2 | 27. 1 | 37. 2 |
| 8. 2 | 18. 2 | 28. 2 | 38. 2 |
| 9. 1 | 19. 3 | 29. 3 | 39. 3 |
| 10. 2 | 20. 3 | 30. 2 | 40. 1 |

(මුළු ලකුණු 01 X 40 = 40)

## II පත්‍රය

(01) i. මිශ්‍ර බෝග වගාව (ලකුණු 1 X 2 = 2)

ii. a. ෆැබේසියේ - බෝංචි, දඹල, මෑ (ලකුණු 1/2 X 2 = 1)

b. කියුකබිටේසියේ - කරවිල, පතෝල, වට්ටක්කා, මෑ (ලකුණු 1/2 X 2 = 1)

iii. කොම්පෝස්ට් පොහොර සෑකසීමට
වසුන් ලෙස
සත්ත්ව ආහාර ලෙස (ලකුණු 1 X 2 = 2)

iv. උදැල්ල, උදළු මුල්ලුව, මුල්ලුව, අලවංගුව (ලකුණු 1/2 X 4 = 2)

v. බර අඩුවීම
ආවේණික වර්ණය නොමැති වීම.
ආවේණික සුවඳ නොමැති වීම.
පලතුරු වල රසවත් බව අඩුවීම. (ලකුණු 1 X 2 = 2)

vi. වියදම අඩුවීම / පරිසර දූෂණය අඩුවීම.
වස විසෙන් තොර ආහාර ලබා ගත හැකි වීම.
පාංශු ලක්ෂණ ආරක්ෂා වීම.
පාංශු ජීවීන් ආරක්ෂා වීම. (ලකුණු 1 X 2 = 2)

vii. a. සාන්ද්‍රීකරණය - ජෑම්, සෝස්, චට්නි සෑදීම.
ශීතනය - ශීතකරණයේ තැබීම. (ලකුණු 1 X 1 = 1)

b. ඉහළ උෂ්ණත්වයට ඔරොත්තු දීම / ආහාර සමඟ ප්‍රතික්‍රියා නොකිරීම / තෙතමනය, වාතය, ක්ෂුද්‍ර ජීවීන්ට ඇතුළුවිය නොහැකි වීම. (ලකුණු 1 X 1 = 1)

viii. a. සීරීම

b. හොඳින් අතුල්ලා පිරිසිදු ජලයෙන් සේදීම. (ලකුණු 1 X 2 = 2)

ix. a. හෙරින්බෝන් / සමාන්තර (ලකුණු 1 X 1 = 1)

b. හෙරින්බෝන් සමාන්තර (ලකුණු 1 X 1 = 1)



x. හතු වගාව / මී මැසි පාලනය / ජීව වායු ඒකකය
සත්ව පාලනය / විසිතුරු පත්‍රික ශාක /මල් වගාව /තවාන් පාලනය (ලකුණු 1 X 2 = 2)

(මුළු ලකුණු 20)

(02) i. a. මිලි මීටර - mm

b. සෙල්සියස් - $^0C$

c. ලක්ස්

d. පැයට කි.මී. - km /h (ලකුණු 1/2 X 4 = 2)

ii. හිතකර - මද සුළඟ - පරාගනයට හිතකර ය.

අහිතකර - තද සුළඟ - පරාග හා කලංක වියළී යාම, ගිලිහී යාම(ලකුණු 1 X 2 = 2)

iii.a. වැලි බොරළු, වැලි (රළු වැලි /සියුම් වැලි) රොන්මඩ, මැටි (ලකුණු 1/2 X 4 = 2)

b. පසේ ඇති විවිධ විශාලත්වයෙන් යුත් පස් අංශුවල (වැලි, රොන්මඩ හා මැටි) සාපේක්ෂ ව්‍යාප්තිය (ලකුණු 1 X 1 = 1)

c. බෝග තෝරා ගැනීමට බිම් සැකසීමේ උපකරණ තෝරා ගැනීමට ජල සම්පාදන ක්‍රම සැලසුම් කිරීමට පාත්ති සකස් කිරීමේ දී / පාත්ති වල උස තීරණයට පාංශු සංරක්ෂණ ක්‍රම තෝරා ගැනීමේ දී (ලකුණු 1 X 3 = 3)

(මුළු ලකුණු = 10)

(03) i. බීජ අපතේ යාම අඩු ය.

බීජ සඳහා යන වියදම අඩු ය.

නිරෝගී පැළ ලබා ගත හැකි වීම ය.

ඒකාකාර වගාවක් පවත්වා ගැනීම ය. (ලකුණු 1 X 2 = 2)

ii.a. 1 m පළල 3m දිග පාත්තියක් සකස් කරයි.

පොළව මට්ටමේ සිට 15 cm උසට පාත්තියක් සකස් කිරීම.

පොළව මට්ටමින් 10 cm ඉහළ පස් ස්ථරය ඉවත් කර තවාන් මාධ්‍ය / මිශ්‍රණය 5 cm උසට යෙදීම.

පාත්තියේ සිරස් පැති තරමක් ආනතව හා තදට සකස් කරනු ලැබේ.(ලකුණු 1 X 4 = 4)

b. යොදා ගන්නා ද්‍රව්‍ය

හලාගත් මතුපිට පස් හා හලාගත් කාබනික පොහොර (ලකුණු 1/2 X 2 = 1)

අනුපාතය 1 : 1 (ලකුණු 1/2 X 2 = 1)

iii. කරවිල / පතෝල / බණ්ඩක්කා / රාබු / කැරට් / වට්ටක්කා / පුහුල් / මෑ / බෝංචි / දඹල (ලකුණු 1/2 X 4 = 2)

(මුළු ලකුණු = 10)

(04) i.

| a | | b |
|---|---|---|
| රෛසෝමය. | - | කහ / ඉඟුරු / කැනාස් |
| කෝමය. | - | හබරල / ගහල / කිරිඅල |
| බල්බය. | - | ලූණු / ලීක්ස් / ටියුලිප් |
| ස්කන්ධාකන්ධය. | - | අර්තාපල් |

වර්ගයකට (ලකුණු 1/2 X 4 = 2)

නිදසුන් (ලකුණු 1/2 X 4 = 2)

ii.a. පෙට්‍රි දීසි ක්‍රමය

රැග්ඩෝල් ක්‍රමය (ලකුණු 01)

b. පෙට්‍රි දීසි ක්‍රමය

පෙට්‍රි දීසිය මත තීන්ත පොවන කඩදාසියක් / පෙරහන් කඩදාසියක් එළා එය තෙත් කර, ඒ මත ගණන් කළ බීජ සංඛ්‍යාවක් අතුරයි. අවශ්‍ය විට ජලය යොදයි. දින 3 කට පසු පැළවූ බීජ සංඛ්‍යාව අනුව ප්‍රරෝහණ ප්‍රතිශතය සොයයි.



බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සංවර්ධන අංශය

රැග්ඩෝල් ක්‍රමය

20 cm x 20 cm කපු රෙදි කැබැල්ලක් ජලයේ තෙමා මේසයක් මත දිග හැර ගනී.

එහි කෙළවර කෝටුවක් තබයි. (25 cm පමණ)

එම රෙදි කැබැල්ල මත බීජ 100 පේළි 10 වන සේ අතුරයි.

රෙදි කැබැල්ල කෝටුව වටා ඔතයි. දෙකෙළවර ගැට ගසා ජල බඳුනක දමා දින 3 - 5 පසු පැලවූ බීජ ගණන අනුව ප්‍රරෝහණ ප්‍රතිශතය සොයයි. (ලකුණු 1 X 3 = 3)

iii. a. පොළොවට නැවිය නොහැකි අතු මුල් අද්දවා ගැනීමට යොදා ගන්නා ක්‍රමයකි. (අත්තේ පොතු වලයක් ඉවත් කර එතැනට පස් මිශ්‍රණය තබා පොලිතීනයකින් ගැට ගසා තබයි.) (ලකුණු 1 X 1 = 1)

b. පේර, ජම්බු, දෙලුම්, චෙරි (ලකුණු 1 X 1 = 1)

(මුළු ලකුණු 10)

(05) i. a. මනා බිම් සැකසීම

නියමිත පරතරයට බෝග වගාව

අකින් උදුරා දැමීම

උදළු ගෑම

වසුන් යෙදීම

ආවරණ බෝග වැවීම

කුඹුරේ ජලය බැඳ තැබීම

රොටරි වීඩරය භාවිතය

රසායන ද්‍රව්‍ය යෙදීම. (ලකුණු 1 X 2 = 2)

b. පිරිසිදු රෝපණ ද්‍රව්‍ය භාවිතය

වල් බීජවලින් තොර කාබනික පොහොර භාවිතය

ජල මාර්ග වල් පැළවලින් තොරව තබා ගැනීම.

පිරිසිදු කෘෂි උපකරණ භාවිතය

වගා බිම අවට වල් පැළවලින් තොරව තබා ගැනීම.

නීති අණ පනත් ක්‍රියාත්මක කිරීම. (ලකුණු 1 X 2 = 2)

ii. a. ශාක මැලවීම, ජලය යෙදූවද යථා තත්ත්වයට පත් නොවීම.

කැඳ අභ්‍යන්තර පටක දුර්වර්ණ වීම

මැලවුණු ශාකයක කඳ කැපූ විට ඇලෙන සුළු දියරයක් වැගිරීම.

කඳෙන් ආගන්තුක මුල් හට ගැනීම. (ලකුණු 1 X 2 = 2)

b. බෝග මාරුව

ප්‍රතිරෝධී ප්‍රභේද වගා කිරීම

ජල වහනය දියුණු කිරීම

පස ජීවානුහරණය

රෝගී ශාක ඉවත් කිරීම. (ලකුණු 1 X 2 = 2)

iii. හානි වූ ඵල ගැඹුරින් වල දැමීම.

පෙරමෝන උගුල් යෙදීම

ඵල ආවරණය කිරීම.

ශාක පාමුල පස අවුස්සා දමා පිළවුන් විනාශ කිරීම. (ලකුණු 1 X 2 = 2)

(මුළු ලකුණු = 10)

(06) i. a. ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්ත වූ රජයේ පශු වෛද්‍ය කාර්යාල පද්ධතියක් තිබීම.
නොමිලේ පශු වෛද්‍ය සේවය සැපයීම.
පශු ණය යෝජනා ක්‍රමය
පශු රක්ෂණ ප්‍රතිලාභ ක්‍රමය
කිරි ගම්මාන ව්‍යාපෘතිය (ලකුණු 1 X 2 = 2)

b. උඩරට කලාපය / මැදරට කලාපය / පහතරට තෙත් කලාපය / පහතරට වියළි කලාපය
පොල් ත්‍රිකෝණය / යාපන අර්ධද්වීපය (ලකුණු 1/2 X 4 = 2)

ii. a - ඝන ආස්තරණය තෙත් වූ විට වියළා ගැනීමට භාවිත කෙරේ.
b - බිත්තර දමන කිකිළියන් සඳහා
c - දිනක්, වයසැති පැටවුන් ප්‍රවාහනයේ දී ඇතිවන කම්පනය අවම කිරීම සඳහා පැටවුන්ට ලබා දේ. (ලකුණු 1/2 X 3 = 1 1/2)

iii. a. වර්ණය වෙනස් වීම
ගන්ධයක් ඇති වීම
කිරි කැටි ගැසීම
කිරි සමඟ රුධිරය මිශ්‍ර වීම. (ලකුණු 1/2 X 3 = 1 1/2)

b. උසස් වර්ගයේ සතෙකුගේ ශුක්‍රාණු ගබඩා කර වසර ගණනාවක් භාවිත කළ හැකිය.
උසස් ගතිගුණ ඇති ආබාධිත පිරිමි සතෙකු වුවද අභිජනනයට යොදා ගත හැකිය.
පට්ටි ගවයකු නඩත්තු කිරීම අවශ්‍ය නොවේ.
වෙනත් රටක උසස් ගවයෙකුගේ ශුක්‍රාණු ආනයන කළ හැකි වීම.
ලිංගික රෝග බෝවීම අඩුයි.
එක් පුං සතෙකුගෙන් විශාල දෙනුන් සංඛ්‍යාවක් සිංචනය කළ හැකි වීම. (ලකුණු 1 X 3 = 3)
(මුළු ලකුණු = 10)

(07) i. a. මනා වාතනය
මනා ජලවහනය
ජලය රඳවා ගැනීමේ හැකියාව
ස්වාරක්ෂක ගුණය පැවතීම.
පළිබෝධවලින් තොර වීම. (ලකුණු 1 X 2 = 2)

b. වහලයේ මුදුන මට්ටම් දෙකකට සැකසීම
වහලයේ විවෘත කළ හැකි කවුළු යෙදීම.
වහලයට පංකා සවි කිරීම.
පැති බිත්තිවල සවි කළ විදුලි පංකා
වරින් වර මිදුමක ලෙස ජලය ඉසීම.
පැති බිත්තිවලට කෘමි ප්‍රතිරෝධී දැල් යෙදීම. (ලකුණු 1 X 2 = 2)

ii.a. අවශ්‍ය ජල ප්‍රමාණය අඩු ය.
ජලය සමඟ පොහොර යෙදිය හැකිය
ජලය අපතේ නොයයි
මූල මණ්ඩලයට පමණක් ජලය ලැබේ.
ස්වයංක්‍රීයව ක්‍රියාත්මක කළ හැකිය. (ලකුණු 1 X 2 = 2)

b. වැඩි අස්වැන්නක් ලැබීම
පළිබෝධ හානි අවම වීම
අස්වැන්නේ ගුණාත්මක බව වැඩිය
අවාරයේ අස්වනු ලබා ගත හැකිය
විවෘත පරිසරයේ වගා කිරීම අපහසු ඉහළ වටිනාකමින් යුතු බෝග වගා කළ හැකි වීම.
වැඩි ආදායමක් ලැබීම. (ලකුණු 1 X 2 = 2)

iii. අධික හිරු එළිය නිසා අස්වැන්න මැලවීම.
බිමට කැඩීම නිසා තැලීම් සීරීම් ආදී යාන්ත්‍රික හානි
කිරි සහිත පලතුරුවල කිරි තැවරී පිලිස්සුම් ඇති වීම.
ක්ෂෙත්‍රයේ ගොඩ ගසා තැබීම නිසා ක්ෂෙත්‍ර තාපය හේතුවෙන් රෝග කාරක වලට ගොදුරු වීම.
(ලකුණු 1 X 2 = 2)
(මුළු ලකුණු = 10)

PAST PAPERS WIKI

# ප්‍රශ්නපත්‍ර පොත්
# ගෙදරටම ගෙන්වා ගන්න
# ඔන්ලයින් ඕඩර් කරන්න

www.store.pastpapers.wiki

# වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal VISA DISCOVER NO PAYPAL ACCOUNT NEEDED!

# ONLINE BOOK STORE

An evening of fun for young readers

